# බළන්ගොඩ නගර සභාව

## 2025-06-30 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.06.30**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ. ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේසල ටී. ජයසේන මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ජේ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ සී. චන්දන මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | එච්.ජේ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කළ අතර, කාරක සභාවන් වල විෂය පථය, සංයුතිය තීරණය කිරීම සහ 2025 වර්ෂයේ සභාව පැවැත්වෙන දින තීරණය කිරීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව ද පවසන ලදී.

**01. කාරක සභාවන් වල විෂය පථය, සංයුතිය තීරණය කිරීම.**

**01:01 මුදල් කමිටුව විෂය පථය හා සංයුතිය තීරණය කිරීම.**

බළන්ගොඩ නගර සභාව සඳහා මුදල් කමිටුව නමින් කාරක සභාවක් විය යුතුය යන්නත්, බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව වියදම් අනුමත කිරීම, කර්මාන්ත කමිටුව, පුස්තකාල හා උපදේශන කමිටුව, සෞඛ්‍ය සණ අපද්‍රව්‍ය හා පරිසර කමිටුව, ප්‍රජා සංවර්ධන උපදේශන කමිටුව යන කමිටු වලින් නිර්දේශ කරනු ලබන වියදම් සඳහා අනුමැතිය ලබාදීම, ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම, නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකුල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම එම කාරක සභාවේ කාර්යය වන්නේද යන්නත් ඒ වූ කාරක සභාව සභාපති ඇතුළුව සභිකයන් 06 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය යන්නත් ගරු සභාපතිතුමා සභාවට යෝජනා කරන ලදුව එකී යෝජනාව එන්.ඒ සී. චන්දන මැතිතුමා ස්ථිර කරන ලදී.

මුදල් කාරක සභාව පිළිබඳව කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

මුදල් කාරක සභාවේ සංයුතිය ගරු සභාපති සමග සභිකයින් 09 ගෙන් සමන්විය යුතු බවට ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනා කරන ලදුව, ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ සී. චන්දන මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී. නමුත් කාරක සභාවන් වල සංයුතිය ඉරට්ටේ

සංඛ්‍යාවක් විය යුතු බැවින්, ඉහත යෝජනාව ගරු සභාපති සමග සභිකයන් 08 දෙනෙකුගෙන් සමන්විත යුතු බවට ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉහත යෝජනාව සංශෝධනය කරන ලදුව, ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ සී. චන්දන මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත සභිකයින් 08 දෙනෙකුගෙන් සමන්විත යුතු බවට වන යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**01:02 කර්මාන්ත කමිටුවේ විෂය පථය හා සංයුතිය තීරණය කිරීම.**

බළන්ගොඩ නගර සභාව සඳහා කර්මාන්ත කමිටුව නමින් කාරක සභාවක් විය යුතුය යන්නත්, බළන්ගොඩ නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, අදාළ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කමිටුවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, සංවර්ධන කටයුතු සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම එම කාරක සභාවේ කාර්යය වන්නේය යන්නත් ඒ වූ කාරක සභාව සභාපති ඇතුළුව සභිකයන් 06 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය යන්නත් ගරු සභාපතිතුමා සභාවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

මුදල් කාරක සභාව පිළිබඳව කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදී.

අනතුරුව කර්මාන්ත කමිටුව සඳහා සභාපති ඇතුළුව සභිකයින් 10 දෙනෙකු විය යුතු බවට ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත සභිකයන් 10 දෙනෙකුගෙන් සමන්විත විය යුතු බවට වන සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**01:03 පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවේ විෂය පථය හා සංයුතිය තීරණය කිරීම.**

බළන්ගොඩ නගර සභාව සඳහා පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව නමින් කාරක සභාවක් විය යුතුය යන්නත්, බළන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ මුදල් කමිටුවට හා සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු එම කාරක සභාවේ කාර්යය වන්නේද යන්නත් ඒ වූ කාරක සභාව සභාපති ඇතුළුව සභිකයන් 06 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය යන්නත් ගරු සභාපතිතුමා සභාවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පිළිබඳව කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදී.

අනතුරුව පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව සඳහා සභාපති ඇතුළුව කොට්ඨාශ නියෝජනය කරමින් සභිකයින් 10 දෙනෙක්ද ප්‍රජාව නියෝජනය කරමින් පුරවැසියන් 10 දෙනෙක්ද විය යුතු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**01:04 පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීම**

බළන්ගොඩ නගර සභාව සඳහා පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවක් විය යුතුය යන්නත්, බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබා දීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කමිටුවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම, පුස්තකාල සාමාජික ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල

ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් එම කාරක සභාවේ කාර්යය වන්නේද යන්නත් ඒ වූ කාරක සභාව සභිකයන් 06 දෙනෙකුගෙන්ද ප්‍රජාව නියෝජනය කරමින් පුරවැසියන් 06 දෙනෙකුගෙන්ද සමන්විත විය යුතුය යන්නත් ගරු සභාපතිතුමා සභාවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**01:05 සංවර්ධන උපදේශන කමිටුවේ විෂය පථය හා සංයුතිය තීරණය කිරීම.**

බළන්ගොඩ නගර සභාව සඳහා සංවර්ධන උපදේශන කමිටුව විය යුතුය යන්නත්, බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු එම කාරක සභාවේ කාර්යය වන්නේද යන්නත් ඒ වූ කාරක සභාව සභිකයන් 06 දෙනෙකුගෙන්ද ප්‍රජාව නියෝජනය කරමින් පුරවැසියන් 06 දෙනෙකුගෙන්ද සමන්විත විය යුතුය යන්නත් ගරු සභාපතිතුමා සභාවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**02. 2025 වර්ෂයට අදාලව සභාව පවත්වන දිනය තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව 2025 වර්ෂයට අදාලව මහ සභාව සෑම මාසයකම දෙවන අඟහරුවාදා පැවැත්වීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 11.00 ට පමණ මෙදින විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

කේ. පී.පේමදාස,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.